මාතෘකාව: සම්මා ආජීවය හෙවත් යහපත් දිවි පැවැත්ම

# *Sammā Ājīva*, Right Living

The term *Ājīva* is defined in various places by various scholars as livelihood. When the discourses found in the Theravada Tradition are taken into consideration, no such a definition is applied into the term *Ājīva*. This is a result of wrong reading the discourse. Vanijjā Sutta of Aṅguttara Nikaya gives the fivefold band trading in relation to the householder whose job is trading or selling. However, Mahacattarisaka Sutta explains *Micchā Ājīva* directing to the *Ariyasavakas* (Noble Ones) as those that should not be practiced by. They are kuhanā, lapanā, nemittikatā, nippesikatā, labhena labhaṃ nijigimsanatā.

Therefore, the purpose of this paper is to show what should be practiced by those who follow the fifth path factor of the Noble Eightfold Path.

**ඉලුක්වෙල ධම්මරතන හිමි**
BA (hons.) BPU, MA (PGIPBS)
**කථිකාචාර්ය (ආධුනික)**
**බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**

## සම්මා ආජීවය හෙවත් යහපත් දිවි පැවැත්ම

ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි පස්වන අංගය සම්මා ආජීවය යි. එය යහපත් දිවි පැවැත්ම යි. ඇතැමුන් මෙය යහපත් ජීවනෝපාය ලෙස නම් කිරීම හේතුවෙන් මේ පිළිබඳ විවිධ ව්‍යාකූලතා මතු වී ඇත. එමනිසා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම මෙහි අරමුණ යි.

සමණමණ්ඩිකා සූත්‍රයේ දී පඤ්චකඞ්ග ගෘහපතියා උග්ගාහමාන පිරිවැජියාගේ ඉගැන්වීමක් වූ පිරිපුන් කුසල් ඇති උතුම් පුද්ගලයකු සතු විය යුතු ගුණධර්ම හතරක් පෙන්වා දෙයි.

1. න කායෙන පාපකං කම්මං කරොති - කයින් පව්කම් නො කරයි.
2. න පාපකං වාචං භාසති - ලාමක වචන නො කියයි.
3. න පාපකං සඞ්කප්පං සඞ්කප්පෙති - ලාමක සංකල්ප නො කරයි.
4. න පාපකං ආජීවං ආජීවති - ලාමක ආජීවය නො කරයි. (ම.නි. 2. පිට 368)

මෙම කරුණු විස්තර කළ බුදුරජාණන් වහන්සේ මෙකී ලාමක ධර්ම උඩුකුරුව සයනය කරන කුඩා දරුවෙකු තුළ දක්නට නො ලැබුණ ද එම ළදරුවා පිරිපුන් කුසල් ඇත්තෙකු කොට සැලකිය නො හැකි බව පෙන්වා දුන්හ (ම.නි. 2. පිට 368). විශේෂයෙන් ම දහරස්සහි ඵපති, කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස ආජීවො තිපි න හොති, කුතො පන පාපකං ආජීවං ආජීවිස්සති අඤ්ඤත්‍ර මාතු ථඤ්ඤා (ම.නි. 2. පිට 368) යනුවෙන් පෙන්වා දුන් පරිදි, බාල වූ උඩුකුරුව හෝනා ළදරු හට ආජීවය ද නො වෙයි. මවගේ තනකිරි මිස ලාමක ආජීවයක් නොවන බව ද පෙන්වා දී ඇත.

මහා අස්සුපුර සූත්‍රයේ දී ශ්‍රමණකාරක ධර්ම විස්තර කිරීමේ දී ශ්‍රමණයකු සතු විය යුතු ගුණ ධර්ම ලෙස පහත සඳහන් කරුණු දක්වා ඇත (ම.නි. 1. පිට 638).

1. හිරි-ඔත්තප්ප දෙකෙන් යුතු බව
2. පිරිසිදු කාය සමාචාර
3. පිරිසිදු වචීසමාචාර
4. පිරිසිදු මනොසමාචාර
5. පිරිසිදු ආජීවය
6. පිරිසිදු ඉන්ද්‍රිය සංවරය ඇති බව
7. භෝජනයෙහි පමණ දැනීම
8. නින්දෙහි පමණ දැනීම
9. සිහිනුවණින් යුතු බව

මාතෘකාවː සම්මා ආජීවය හෙවත් යහපත් දිවි පැවැත්ම

ඒ අනුව, මෙහි විස්තර වන පිරිසිදු ආජීවය භික්ෂූන් වහන්සේ සඳහා දේශිත අතර එය මෙසේ විස්තර වෙයි.

''පරිසුද්ධො නො ආජීවො භවිස්සති උත්තානො විවටො න ච ඡිද්දවා සංවුතො ච. තාය ච පන පරිසුද්ධා ජීවතාය නෙවත්තානුක්කංසිස්සාම, න පරං වම්භිස්සාමා ති (ම.නි. 1. පිට 636)'', අපගේ ආජීවය පිරිසිදු වෙයි, ආවරණය නො වෙයි, විවෘර්ත වෙයි, සිදුරු නැත්තේ වෙයි, සීමාසහිත වූයේ වෙයි, එමගින් තමා කැපී පෙනීමට උත්සාහ නො කරයි, අනුන් ගැරහීමට උත්සාහ නො කරයි.

සම්මා ආජීවය යනු මිච්ඡා ආජීවයෙන් වෙන්වීම යි. ඒ බව සම්මා ආජීවය විස්තර කිරීම සඳහා යොදා ගෙන ඇති, ''ඉධාවුසො අරියසාවකා මිච්ඡා ආජීවං පහාය සම්මා ආජීවෙන ජීවිකං කප්පේති''. ඇවැත්නි, මෙහි දී ආර්යශ්‍රාවකයා වැරදි දිවිපැවැත්මෙන් වෙන් ව නිවැරදි දිවිපැවැත්මෙන් කටයුතු කරයි යන පාඨයෙන් පැහැදිලි වෙයි. මිච්ඡා ආජීවය විස්තර කරන බොහෝ පොත පත එය විස්තර කොට ඇත්තේ නො කළයුතු වෙළදාම් වශයෙනි. භික්ෂුව වනාහි වෙළෙඳ ව්‍යාපාර ආදී කටයුතුවල නො යෙදෙන්නෙකි. කෙසේ වුව ද සම්මා ආජීවය නො කළ යුතු වෙළදාම්වලින් වැළකීම ලෙස දක්වා ඇත්තේ කුමන හෙයින් දැයි ප්‍රථමයෙන් විමසා බැලීම යුක්ති යුක්ත ය.

සම්මා ආජීවය විස්තර වන සූත්‍ර ගණනාවකි. ඒ අතරින් දීඝ නිකායේ මහාසතිපට්ඨාන සූත්‍රය, මජ්ඣිම නිකායේ සච්චවිභංග සූත්‍රය හා මහාචත්තාරීසක සූත්‍රය, හා සංයුත්ත නිකායේ විභංග සූත්‍රය මෙහි දී විශේෂ අවධානයට ලක්වේ. මෙම සූත්‍ර අතුරෙන් මහාචත්තාරීසක සූත්‍රය හැර අනෙකුත් සූත්‍ර සම්මා ආජීවය පැහැදිලි කිරීම සඳහා යොදා ගෙන ඇත්තේ එක ම පද මාලාවකි.

කතමො ච, භික්ඛවෙ (ආවුසො), සම්මාආජීවො? ඉධ, භික්ඛවෙ (ආවුසො), අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති. අයං වුච්චති, භික්ඛවෙ, සම්මාආජීවො (දී.නි. 2, පිට 494ː ම.නි. 3, පිට 518ː සං.නි. 5 (1), පිට 14).

මහාචත්තාරීසක සූත්‍රයේ දී සම්මාආජීවය පැහැදිලි කිරීම සඳහා මිච්ඡාආජීවය උපයෝගී කර ගනී. ඉන් අනතුරුව, මිච්ඡාආජීවයෙන් වෙන්වීම සම්මා ආජීවය බවත්, ඒ සඳහා ලෞකික හා ලෝකෝත්තර වශයෙන් ක්‍රමෝපායයන් දෙකක් ඇති බවත්, එම ක්‍රම අනුගමනය කිරීමෙන් සම්මාආජීවය පූරණය කළ හැකි බවත් පෙන්වා දෙයි.

කතමො ච, භික්ඛවේ, මිච්ඡාආජීවො? කුහනා, ලපනා, නේමිත්තිකතා, නිප්පේසිකතා, ලාභේන ලාභං නිජිගිංසනතා. අයං, භික්ඛවේ, මිච්ඡාආජීවො.

කතමො ච, භික්ඛවේ, සම්මාආජීවො? සම්මාආජීවං පහං, භික්ඛවේ, ද්වයං වදාමි. අත්ථි, භික්ඛවේ, සම්මාආජීවො සාසවො පුඤ්ඤභාගියො උපධිවෙපක්කොː අත්ථි, භික්ඛවේ, සම්මාආජීවො අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගො (ම.නි. 3, පිට 218).

දීඝ නිකාය අටුවාවේ සාමඤ්ඤඵල සූත්‍ර වර්ණණාවේ දී ''උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු'' යන්න විවරණය කිරීමේ දී ඒ යටතේ එන 'කො ආජීවො' යන්න විවරණය කරමින් මෙසේ දක්වා ඇත.

කො ආජීවොති පඤ්ච මිච්ඡාවණිජ්ජා පහාය ධම්මෙන සමෙන ජීවිතකප්පනං. වුත්තඤ්හෙතං- ''පඤ්චිමා, භික්ඛවේ, වණිජ්ජා උපාසකෙන අකරණියා. කතමා පඤ්ච? සත්ථවණිජ්ජා, සත්තවණිජ්ජා, මංසවණිජ්ජා, මජ්ජවණිජ්ජා, විසවණිජ්ජා. ...'' (සුමංගලවිලාසිනී. 1, පිට 164).

මෙහි දී වෙළදාමෙහි නියුතු උපාසකයෙකු විසින් නොකළ යුතු වෙළදාම් පහක් මිච්ඡාවණිජ්ජා ලෙස නම් කොට ඇත. ඒ අනුව, අවි ආයුධ වෙළදාම, සතුන් වෙළදාම, මස්මාංශ වෙළදාම, මත්ද්‍රව්‍ය හා මත්පැන් වෙළදාම, හා විශ වෙළදාම යන වෙළදාම්හි නො යෙදෙමින් දැහැමින් සෙමින් තම ජීවනෝපාය පවත්වාගෙන යා යුතු බව පෙන්වා දී ඇත. තවදුරටත් මේ පිළිබඳ විමසා බැලීමේ දී එම අටුවා පාඨය අංගුත්තර නිකායේ පංචක නිපාතයේ වණිජ්ජා සූත්‍රයෙන් උපුටා ගන්නා ලද්දක් බව ද පැහැදිලි වෙයි. ඒ අනුව, උපාසකයෙකු විසින් අනුගමනය නො කළ යුතු වෙළදාම් පහක් පිළිබඳව සුමංගලවිලාසිනියෙහි විස්තර කොට ඇති බව පැහැදිලි වේ.

මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා පෙන්වා දෙන්නේ සම්මා ආජීවය ආර්යශ්‍රාවකයා අරමුණු කොට දේශනා කොට ඇති බවයි. ''ඉධ, භික්ඛවෙ (ආවුසො), අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති'' යනුවෙන් දක්වා ඇති හෙයින් එය ඉතා පැහැදිලිය. ඒ අනුව, ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් පස්වන අංගය වන සම්මාආජීවය නො කළයුතු වෙළදාම්වලින් වැළකීම පිළිබඳ විස්තර වන්නක් නොව කුහනා, ලපනා, නේමිත්තිකතා, නිප්පේසිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතාවන්ගෙන් වැළකීම පිළිබඳ වන විස්තරයක් බව එතුමා තවදුරටත් පෙන්වා දෙයි (දේශනය, 2005-2006).

උක්ත කරුණු පිළිබඳ අවධාය යොමු කළ විට සම්මා ආජීවය යනු කුමක් විය යුතු දැ යි සකාරණව පැහැදිලි වෙයි. එම කරුණු වඩාත් පහසුවෙන් අවබෝධ කරගැනීම සඳහා විශුද්ධි මාර්ගයෙහි ශීල නිද්දේශයෙහි එන ආජීව පාරිසුද්ධි සීලය මෙහි දී විමසා බැලේ.

**ආජීව පාරිසුද්ධි සීලය**

''ආජීවය හේතු කොට ගෙන පණවා වදාළ සවැදෑරුම් ශික්‍ෂාපදයන් ව්‍යතික්‍රමණය කිරීම් වශයෙන් ද, කුහනා-ලපනා-නෙමිත්තිකතා-නිප්පෙසිකතා-ලාභෙන ලාභං නිජිගිංසනාතාදී පාප ධර්මයන් ගේ වශයෙන් ද පවත්නා වූ මිච්ඡාජීවයෙන් වැළකීම ආජීව පාරිසුද්ධි සීලය යි''

ආජීවය හේතු කොට ගෙන පණවා වදාළ සවැදෑරුම් ශික්‍ෂාපද මෙසේ ය.

01. **පාරාජිකාවඃ** පාපේච්ඡ වූ යම් උපසම්පන්න භික්‍ෂුවෙක් ආජීව හේතුයෙන් තමා සතන්හි අවිද්‍යමාන වූ ධ්‍යාන - මාර්ග - ඵලාදී උත්තරි මනුෂ්‍ය තමා කෙරෙහි ඇතැයි කියා නම් ඒ භික්‍ෂු පාරාජිකාපත්තියට පැමිණෙයි.

02. **සංඝාදිසේසයඃ** යම් උපසම්පන්න භික්‍ෂුවෙක් ආජීව හේතුවෙන් ස්ත්‍රී පුරුෂ දෙදෙනෙකුන් පිළිබඳ එකෙනෙහි වන සංගමය පිණිස හෝ ඔවුනොවුන්ගේ පණිවිඩ කියා නම් ඒ භික්‍ෂු සංඝාදිසේසාපත්තියට පැමිණෙයි.

03. **ථුල්ලච්චයඃ** යම් උපසම්පන්න භික්ෂුවෙක් ආජීව හේතුකොට ගෙන දායකයා හට ''නුඹගේ විහාරයෙහි වසන භික්ෂු රහතන් වහන්සේ නමෙකැ''යි තමා උදෙසා අනියමයෙන් කියා නම් ඒ භික්ෂු ථුල්ලච්චයාපත්තියට පැමිණෙයි.

04. **පාචිත්තියඃ** යම් උපසම්පන්න භික්ෂුවෙක් නොගිලන් වූයේ ම ආජීවය හේතු කොට ගෙන කිරි ආදී ප්‍රණීත භෝජන තමා පිණිස ගෙන්වා ගෙන වළඳානම් ඒ භික්ෂු පාචිත්තියාපත්තියට පැමිණෙයි.

05. **පාටිදේසනීයඃ** යම් උපසම්පන්න භික්ෂුණියක් නොගිලන් වූවා මැ ප්‍රණීත භෝජන තමා පිණිස ගෙන්වා ගෙන වළඳා නම් ඒ භික්ෂුණී පාටිදේසනීයාපත්තියට පැමිණෙයි (විශුද්ධි මාර්ගය. පිට. 34).

06. **දුක්කටයඃ** යම් උපසම්පන්න භික්ෂුණියක් නොගිලන් වූවා ම සූප හෝ ඕදන හෝ තමා පිණිස ගෙන්වා ගෙන වළඳ නම් ඒ භික්ෂුණී දුකළා ඇවැතට පැමිණෙයි.

**කුහනා**

> ''තත්‍ථ කතමා කුහනා? ලාභසක්කාර සිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පච්චය පටිසෙධන සංඛාතෙන වා සාමන්තජප්පිතෙන වා ඉරියාපථස්ස වා අට්ඨපනා ඨපනා සණ්ඨපනා භාකුටිතා භාවකුටියං කුහනා කුහායනා කුහිතත්තං අයං වුච්චති කුහනා''

ලාභ සත්තාර කීර්ති පතන්නා වූ, පාපේච්ඡ වූ හෙවත් නැති ගුණ දක්වනු කැමැති වූ, ලෝභයෙන් මඩනා ලද්දා වූ, භික්ෂුවගේ පච්චයපටිසෙධන (ප්‍රත්‍ය ප්‍රතික්ෂේප කරමින් අපේක්ෂා කිරීම) වශයෙන් හෝ සාමන්තජප්පන (තමා තුළ නැති ගුණ ධර්ම පෙන්වමින් කථා කිරීම) වශයෙන් හෝ ඉරියාපථසන්නිස්සිත (යාම් ඊම් ආදී ඉරියව්වෙන් ජනයා විස්මයට පත් කිරීම) වශයෙන් හෝ යම් මුහුණ හකුළුවන බවෙක් වෙයි ද එය කුහනා යයි කියනු ලැබේ (පිට 35).

**ලපනා**

> ''තත්‍ථා කතමා ලපනා? ලාභසක්කාර සිලොක සන්නිස්සි තස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුග්ගසූප්‍යතා පාරිභට්ටතා අයං වුච්චති ලපනා''

ලාභ සක්කාර කීර්ති පතන්නා වූ පාපෙච්ඡ වූ ලොභයෙන් මැඩීගත් භික්ෂුවකගේ පරා (අනුන්) පිළිබඳ යම් ආලපනාවක් (තමා පළමුකොට කථා කිරීම) ලපනාවක්, (විචාළ කෙනෙකුට එසේ කීම) සල්ලපනාවක් (දායකායා කළකිරීමෙහි භීතියෙන් ඔහුට ඉඩ තබා කථා කිරීම), උල්ලපනාවක් (දායකයා උසස් කොට කථා කිරීම), සමුල්ලපනාවක් (සියලු ආකාරයෙන් දායකයා උසස් කොට කථා කිරීම), උන්නහනාවක් (දෙයක් ලබා ගැනීමේ අරමුණින් කථා කිරීම), සමුන්නහනාවක් (සියලු ආකාරයෙන් අවුලේලා කථා කිරීම), උක්කාචනාවක් (තමා පිළිබඳ උසස් කොට ප්‍රකාශ කිරීම හෝ

ඇගවීම), සමුක්කාචනාවක් (සියලු ආකාරයෙන් කරන උද්දීපයන්), අනුප්පියභාණිතාවක් (සත්‍ය බව හෝ ධර්මානුකූල බව නොසලකා කතා කිරීම), චාටුකම්‍යතාවක් (තමා දායකයාට වඩා පහත් ලෙස පැවතීම), මුග්ගසූපත්‍යතාවක් (අසත්‍ය හා අසත්‍ය ඇතුලත් වන සේ කථා කිරීම), පාරිභට්ටතාවක් (දරුවන් වඩා ගැනීම), වේද එය ලබනා යයි කියනු ලැබේ (පිට 39).

**නේමිත්තිකතා**

> ''තත්ථ කතමා නෙමිත්තිකතා? ලාභ සක්කාර සිලොක සන්නිස්සිතස්ස පාපිච්චස්ස ඉච්ඡාපකතස්ස යං පරෙසං නිමිත්තං නිමිත්තකම්මං, ඔභාසො ඔභාසකම්මං සාමන්නජප්පා පරිකථා අයං වුච්චති නෙමිත්තිකතා''

ලාභ සත්කාර කීර්තිකාමී වූ පාපෙච්ච වූ ඉච්ඡාපකත වූ භික්ෂුව ගේ පරා පිළිබඳ යම් නිමිත්තයෙක් (තමා වෙත සිත් උපදවන කරුණක්) නිමිත්තකර්මයෙක් (නිමිති දැක්වීම) ඔභාසයෙක් (ප්‍රත්‍ය පිළිබඳ කථා කිරීම) ඔභාසකම්මයෙක් (උපක්‍රමයෙන් ප්‍රත්‍ය ගෙන්වා ගැනීම) සාමන්තජප්පාවෙක් (කුළුපග සේ කටයුතු කිරීම) පරිකථාවෙක් වෙයි ද එය නෙමිත්තිකතාය යි (පිට. 39).

**නිප්පෙසිකතා**

> ''තත්ථ කථමා නිප්පෙසිකතා? ලාභසක්කාර සිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං අක්කොසනා වම්භනා ගරහණා උක්ඛෙපණා සමුක්ඛෙපණා ඛිපනා සංඛිපනා පාපනා සම්පාපනා අවණ්ණහාරිතා පරපිට්ඨිමංසිකා අයං වුච්චති නිප්පෙසිකතා''

ලාභ සත්කාර කීර්තිකාමී වූ පාපෙච්ඡ වූ ඉච්ඡාපකත වූ භික්ෂුවගේ පරහට යම් අක්කොසනාවෙක් (දස ආක්‍රොශ වස්තුවෙන් බැණ වැදීම) ගරහණාවෙක් (ගැරහීමෙන්) උක්ඛෙපනාවෙක් (උස් හඬින් සැර කිරීම) සමුක්ඛෙපනාවෙක් (නොදන්නා අයෙකු උසස් කිරීම) ඛිපනාවෙක් (කවට කම් කිරීම) සංඛිපනාවෙක් (නොදෙන්නෙකැයි කවට කම් කිරීම) පාපනාවෙක් (නුගුණ සැම තැන පැනවීම) සම්පාපනාවෙක් (සියලු ආකාරයේ පැණවීම්) අවණ්නහාරිතාවෙක් (නුගුණ ගම් රටෙහි පැතිරවීම) පරසිට්ඨිමංසිකාවෙක් (සම්මුඛයෙහි ගුණ ද අසම්මුඛයෙහි නුගුණද පැවසීම) වන්නේ ද එය නිප්පෙසිකතා යි (පිට. 42).

**ලාභේන ලාභං නිජිගිංසනතා**

> ''තත්ථ කතමා ලාභෙන ලාභං නිජිගිංසනතා? ලාභ සක්කාර සිලොකසන්නිස්සිතො පාපිච්ඡො ඉච්ඡාපකතො ඉතො ලද්ධං ආමිසං අමුත්‍ර හරති අමුත්‍ර වා ලද්ධං ආමිසං ඉධාහරති. යා ඒවරූපා ආමිසේන ආමිසස්ස එට්ඨී ගවෙසි පරියෙට්ඨී එසනා ගවෙසනා පරියෙසනා අයං වුච්චති ලාභෙන ලාභං නිජිගිංසනතා''ති

ලාභ සත්කාර කීර්තිකාමී පාපෙච්ඡ ඉච්ඡාපකත භික්‍ෂු මේ ගෙයින් ලත් ආමිෂය අනෙක් ගෙයකට ගෙනයයි. ඒ ගෙයින් ලත් ආමිෂය මේ ගෙට ගෙන එයි. මෙබඳු වූ ආමිෂ පිළිබඳ යම් කැමැත්තෙක් සෙවීමෙක් නැවත නැවත සෙවීමෙක් වේද, එය ලාභයෙන් ලාභය සෙවීම යැයි කියනු ලැබේ (පිට. 44).

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය


දීඝනිකාය (ද්විතීය භාගය). (1976). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. ශ්‍රී ලංකාවː ශ්‍රී ලංකා ජනරජය.

මජ්ඣිමනිකාය (ද්විතීය භාගය). (1973). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. ශ්‍රී ලංකාවː ශ්‍රී ලංකා ජනරජය.

මජ්ඣිමනිකාය (තෘතීය භාගය). (1974). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. ශ්‍රී ලංකාවː ශ්‍රී ලංකා ජනරජය.

මජ්ඣිමනිකාය (ප්‍රථම භාගය). (1676). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. ශ්‍රී ලංකාවː ශ්‍රී ලංකා ජනරජය.

සංයුත්තනිකාය (පංචම භාගය (1)). (1982). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. ශ්‍රී ලංකාවː ශ්‍රී ලංකා ජනරජය.

දීඝනිකායට්ඨකථා (ප්‍රථම භාගය). (1989). (සංස්. සිරි දේවමිත්ත නාහිමි). කොළඹː සයිමන් හේවාවිතාරණ.

බුද්ධඝෝෂ මහා ස්ථවිර. (2004). **විශුද්ධි මාර්ගයː විස්තරාර්ථ සන්න සහිත.** දෙහිවලː බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.